මැතිවරණ
නිරීක්ෂණ
මධ්‍යස්ථානය
தேர்தல்
கண்காணிப்பு
நிலையம்
NPP
ELECTION
MONITORING
CENTRE

27/A, දකුණු වටරවුම පාර,
ජයන්තිපුර, බත්තරමුල්ල

0112 796 388, 077 342 8774
077 343 6505, 077 342 6103

077 728 4895
077 342 8774

emc@npp.lk

මෙහෙයුම් කමිටුව

හිටපු අමාත්‍යාංශ ලේකම්
අශෝක පීරිස්
0773634735

හිටපු අමාත්‍යාංශ ලේකම්
තිස්ස වර්ණසූරිය
0777248074

හිටපු අමාත්‍යාංශ ලේකම්
කේ. ජී. ලීලානන්ද
0773574614

නීතිඥ අකලංක උක්වත්ත
0773725007

පොලිස් සාමූහිකයේ ප්‍රධානි
විශ්‍රාමික ජ්‍යෙ. නි. පොලිස්පති
රවී සෙනෙවිරත්න
0773545265

විශ්‍රාමික ජ්‍යෙ. නි. පොලිස්පති
(මැතිවරණ)
ගාමිනී නවරත්න
0777808444

විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති
ජේ. ඒ. කේ. මාර්ක්
0773652521

විශ්‍රාමික නියෝජ්‍ය පොලිස්පති
ඩී. ගජසිංහ
0714356301

විශ්‍රාමික පොලිස් අධිකාරී
එච්.යූ. පියනන්ද
0777307409

EMC/2024/0122
2024.09.11

සහකාර මැතිවරණ කොමසාරිස් ,
කොළඹ.

**<u>ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාගේ මැතිවරණ ප්‍රචාරණය ප්‍රවර්ධනය කිරීම සඳහා භෝජන සංග්‍රහයක් සූදානම් කිරීම.</u>**

අද දින (11.09.2024) පා.ම. ජගත් කුමාර මහතා විසින් ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාගේ මැතිවරණ ප්‍රචාරනය සඳහා රාජගිරිය තැපෝබ්‍රෙන්හිදි වැඩිහිටි ප්‍රජාව රැස් කර ඔවුනට අහාර පාන වලින් සංග්‍රහ කිරීමට සූදානම් වී ඇති බවට අප හට තොරතුරු වාර්තා වී ඇත.

ජනාධිපතිවරණයක් ප්‍රකාශිත මෙවැනි අවස්තාවක මෙසේ ආහාර පාන වලින් සංග්‍රහ කිරීම මගින් නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට බාධා එල්ලවන බව අප විශ්වාස කරන අතර මෙම සිදුවීම පිළිබඳව සත්‍ය අසත්‍ය බාවය සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලෙසට ගෞරවයෙන් ඉල්ලා සිටිමි.

ස්තූති,
මෙයට විශ්වාසී,

.................................
එච්.යූ පියනන්ද,
මෙහෙයුම් අධ්‍යක්ෂක,
ජාතික ජන බලවේගයේ මැතිවරණ කොමසාරිස් කාර්යාලය.

# දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය - කොළඹ
# மாவட்ட தேர்தல் பிணக்குதீர்வு பிரிவு – கொழும்பு
# District Election Dispute Resolution Center – Colombo

16 වන මහල , "නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
16ஆம் மாடி, "நிலமெதுர", எல்விட்டிகல மாவத்தை, கொழும்பு-05
16th Floor, "Nila Medura", Elvitigala Mawatha, Colombo 05


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | EDR/PRE/2024/Colombo/05 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2024.09. |

ස්ථානාධිපති
ශ්‍රී ලංකා පොලීසිය
බොරැල්ල

<u>ජනාධිපතිවරණය - 2024</u>
<u>කොළඹ දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානයට ලද පැමිණිල්ලක් සම්බන්ධව</u>

2024.09.11 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර මහතාගේ ප්‍රධානත්වයෙන් රාජගිරිය රෝයල් තැප්‍රෝබේන් උත්සව ශාලාවේ දී වැඩිහිටි ප්‍රජාව රැස්කර ආහාර හා භාණ්ඩ බෙදා දීමක් සිදුකරන බවට ජාතික ජන බලවේගයේ මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ දුරකථන අංක 0112796388 මගින් පැමිණිලි කරන ලදි. එදිනම ජාතික ජන බලවේගයේ මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් අධ්‍යක්ෂ එච්.යූ.පියනන්ද මහතා විසින් ලිඛිතව පැමිණිල්ලක් යොමු කරමින් ජනාධිපති අපේක්ෂක රනිල් වික්‍රමසිංහ මහතාගේ මැතිවරණ ප්‍රචාරණය ප්‍රවර්ධනය කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ජගත් කුමාර මහතා විසින් වැඩිහිටි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් රාජගිරිය රෝයල් තැප්‍රෝබේන් උත්සව ශාලාවේ දී භෝජන සංග්‍රහයක් සූදානම් කර ඇති බවට පැමිණිලි කර ඇත. (පැමිණිල්ලේ පිටපතක් අමුණා ඇත.)

02. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.09.11 වන දින ස්ථානීය පරීක්ෂණයක් සිදු කළ අතර, එම ස්ථානයේ වැඩිහිටි ප්‍රජාවගේ සහභාගීත්වයෙන් සමුළුවක් ආරම්භ කර ජනාධිපති අපේක්ෂක සජිත් ප්‍රේමදාස මහතා සහභාගී වීමට නියමිතව තිබූ නමුත් භෝජන සංග්‍රහයක් පැවැත්වීමේ සූදානමක් හෝ භාණ්ඩ බෙදාදීමක් ඒ අවස්ථාවේ නිරීක්ෂණය නොවිය.

03. ඒ අනුව, මෙම පැමිණිල්ල ව්‍යාජ එකක් බව අනාවරණය වූ අතර අවස්ථා ගණනාවකදී උක්ත පැමිණිලිකාර පාර්ශවය විසින් ව්‍යාජ පැමිණිලි ඉදිරිපත් කර ඇත. මෙවැනි ව්‍යාජ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී රජයේ නිලධාරීන්ගේ කාලය හා රජයේ මුදල් නාස්තියක් සිදුවන බැවින් ව්‍යාජ පැමිණිලි සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කඩිනමින් මා වෙත වාර්තා කරන ලෙස ද තවදුරටත් දන්වමි.

එස්.ජී.එන්.ආර්.සුබසිංහ
ප්‍රධාන සහකාර තේරීම්භාර නිලධාරී
දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානය
කොළඹ දිස්ත්‍රික්කය


දුරකථන - 0112050425
ෆැක්ස් - 0112369259
ඊමේල් - **inaudit@moha.gov.lk**


පිටපත:- නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස්, කොළඹ දිස්ත්‍රික්කය - කාරු.දැ.ගැ.ස